7. ඉඩම හෝ එහි යම්කිසි කොටසක් ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව ලිඛිත අවසරයක් නොමැතිව විකිණීම නොකළ යුතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම,
ප්‍රධාන කළමණාකරු - නීති.

08-157/2

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ගල්කිස්ස ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

එෆ්. ආර්. පී. සර්විස් ඇන්ඩ් කම්පනි (ලංකා) ලිමිටඩ්.

2012.02.21 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2006.05.11 වැනි දින අංක 1528 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2007.01.31 වැනි දින අංක 3298 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම එෆ්. ආර්. පී. සර්විස් ඇන්ඩ් කම්පැනි (ලංකා) ලිමිටඩ් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හැට අට මිලියන පන්සිය තිස්හතරයි ශත හැත්තෑහතර (රු. 68,000,534.74) ක මුදලක් 2011.11.25 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 68,000,534.74 ක මුදලට 2011.11.26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1528 සහ 3298 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගාලු පාර, වරිපනම් අංක 515 දරන "ගල්ලිදවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 1987 නොවැම්බර් මස 16 වැනි දින සහ අංක 2476 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් බී වලින් ද සහ ගාලු පාර, වරිපනම් අංක 513 ට අයත් ලොට් සී 1 න් ද, නැගෙනහිරට : ලොට් ඩී වලින් ද, එම්. පී. විජේසිංහ මහත්මිය හිමිකම් කියන ගාලු පාර, වරිපනම් අංක ජී 523 සහ 523/1 දරන දේපළෙන් ද, දකුණට : එච්. වික්ටර් ප්‍රනාන්දු සහ අනෙක් අය හිමිකම් කියන ගාලු පාර, වරිපනම් අංක 517 දරන දේපළෙන් ද, සහ බස්නාහිරට : ගාලු පාරෙන් ද, (ගල්කිස්ස පාර) සහ ලොට් බී වලින් ද, මායිම් වූ එකී අංක 2476 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිතුනයි දශම එකයි දෙක (අ. 0 රූ. 0 පර්. 23.12)ක් විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2266/269 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගාලු පාර, වරිපනම් අංක 511 දරන "ගල්ලිදවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. පී. සමරවීර විසින් මැන සාදන ලද 1995 ජූනි මස 03 වැනි දින සහ අංක 1665ඒ දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් එම් නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගල්කිස්ස පාර, වරිපනම් අංක 509 දරන දේපළෙන් ද, නැගෙනහිරට : ගල්කිස්ස පාර, වරිපනම් අංක 523/3 දරන දේපළෙන් ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඩබ්. අයි. අයි. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1607 දරන පිඹුරට අයත් ලොට් ඒ 1න් ද, සහ ගල්කිස්ස පාර, වරිපනම් අංක 515 දරන දේපළෙන් ද සහ බස්නාහිරට : ගල්කිස්ස පාරෙන් ද, මායිම් වූ එකී අංක 1665ඒ දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම හතරයි පහ (අ. 0 රූ. 0 පර්. 12. 45) විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2304/127 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගාලු පාර, වරිපනම් අංක 513 දරන "ගල්ලිදවත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්. අයි. අයි. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 1994 ජූලි මස 16 වැනි දින සහ අංක 1607 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ 1 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ඒ හි ඉතිරි කොටසින් ද, නැගෙනහිරට : ගල්කිස්ස පාර, වරිපනම් අංක 511/4 දරන දේපළෙන් ද, දකුණට : ගල්කිස්ස පාර, වරිපනම් අංක 515 දරන දේපළෙන් ද, සහ බස්නාහිරට : ගල්කිස්ස පාරෙන් ද, මායිම් වූ එකී අංක 1607 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම නවයයි බිංදුව (අ. 0 රූ. 0 පර්. 3.90) ක් විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1432/292 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද දේපළ නැවත මැනීමකින් පසුව මෙසේ විස්තර වේ :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල -ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගාලු පාර, වරිපනම් අංක 513 දරන "ගල්ලිදවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. දන්තනාරායන විසින් මැන සාදන ලද 1999 පෙබරවාරි මස 25 වැනි දින සහ අංක 2186 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ 1 නැමති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගාලු පාර, වරිපනම් අංක 511 දරන දේපළෙන් ද, (පිඹුරු අංක 2185 ට අයත් ලොට් වයි) ; නැගෙනහිරට : ගාලු පාර, වරිපනම් අංක 511/4 දරන දේපළෙන් ද, (පිඹුරු අංක 2184 ට අයත් ලොට් ඒ), දකුණට : ගාලු පාර, වරිපනම් අංක 515 දරන දේපළෙන් ද, (පිඹුරු අංක 1930 ට අයත් ලොට් සී 2) මායිම් වූ එකී අංක 2186 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම නවයයි බිංදුව (අ. 0 රූ. 0 පර්. 3.90) ක් විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග පිහිටි ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිනී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-133

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ප්‍රධාන කාර්යාලයීය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

යජිව සම්පත් කපුරුබණ්ඩාර.

2012.06.21 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2011.02.03 වැනි දින සහ අංක 3910 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම යජිව සම්පත් කපුරුබණ්ඩාර යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්සිය පනස්දෙලක්ෂ දහදහස් දෙසිය තිස්හයයි ශත අනූහතර (රු. 55,210,236.94) ක මුදලක් 2012.05.23 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 55,210,236.94 ක මුදලට 2012.05.24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3910 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, (ගම්පොල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) උඩබුලත්ගමුව කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ, අඹගමුව ප්‍රාදේශීය සභා සීමාවේ, දික්ඔය, පිහිටි "බිලින්ක්බොනි එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි විජේවර්ධන විසින් පිළියෙල කරන ලද 1984.06.15 වැනි දින අංක 2555ඒ දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් අංක 01 දරන කොටස වන උතුරට : පාර (ප්‍රධාන මාර්ගය) පී පී 80636 හි විස්තර කර ඇති ඉඩම සහ බිලින්ක් බොනි රාජ්‍ය වතුයායෙන් ද, නැගෙනහිරට : බිලින්ක් බොනි රාජ්‍ය වතුයායෙන් සහ පිඹුරු අංක 2555ඒ ලොට් 02න් ද, දකුණට : ඇල්ලබැද්ද කොට්ඨාසයේ ක්‍රිකෝස්වල් ගෲප්වලින් ද, සහ බස්නාහිරට : ඉන්ග්‍රෙස්ට්‍රි ගෲප් බෙරෙට් කොට්ඨාසයෙන් ද, මායිම් වූ එකී අංක 2555ඒ දරන පිඹුර ප්‍රකාරව අක්කර විසිතුනයි රූඩ් දෙකයි පර්චස් එකොළහ (අ. 23 රූ. 2 පර්. 11)ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ. මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 13/265 යටතේ ලියාපදිංචි කර ඇත.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, (ගම්පොල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ) උඩබුලත්ගමුව කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ, අඹගමුව ප්‍රාදේශීය සභා සීමාවේ, දික්ඔය පිහිටි "බිලින්ක් බොනි එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් පිළියෙල කරන ලද 1984.06.15 වැනි දින අංක 2555ඒ දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් අංක 02 දරන කොටස වන උතුරට : බිලින්ක් බොනි රාජ්‍ය වතුයායෙන් සහ පාර (ප්‍රධාන මාර්ග) යෙන් ද, නැගෙනහිරට : ඉන්ග්‍රෙස්ට් ගෲප් හි ඉන්ග්‍රෙස්ට් කොට්ඨාසයෙන් ද, දකුණට : ඇල්ලබැද්ද කොට්ඨාසයේ ක්‍රිකෝස්වල් ගෲප් වලින් ද, සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 1 දරන පාර සහ බිලින්ක් බොනි රාජ්‍ය වතුයායෙන් ද මායිම් වූ එකී අංක 2555ඒ දරන පිඹුර ප්‍රකාරව අක්කර විසි පහයි රූඩ් දෙකයි පර්චස් දහය (අ. 25 රූ. 2 පර්. 10) ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ. මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 43/70 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිනී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-132

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. (ලියාපදිංචි අංක පීකිව් 118 දරන) අධ්‍යක්ෂවරුන් විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

වසන්ත කුමාර ගලගොඩ.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. (ලියාපදිංචි අංක පීකිව් 118 දරන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 ජනවාරි මස 25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දේව මනෝහරන් ස්වාමිනාදන් විසින් සහතික කරන ලද අංක 6042 සහ 2004 ජූලි මස 30 වැනි දින දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුජේක්ශලී කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1279 සහ 2010 නොවැම්බර් මස 25 වැනි දින දරන උකස් බැඳුම්කර (මෙහි මින්මතු "බැඳුම්කර" වශයෙන් හඳුන්වනු ලබන) මගින් බොරලැස්ගමුව, දිවුලපිටිය, ඊ. පෙරේරා මාවතේ, අංක 9/31 දරන ස්ථානයේ පදිංචි වසන්ත කුමාර ගලගොඩ යන අය විසින් (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) මෙහි උපලේඛනයේ සවිස්තරව දැක්වෙන ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය එකී උකස්කරු විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

තවද ඉහත සඳහන් උකස්කරු ඉහත හි බැඳුම්කර මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදුකරන ලදුව, එකී බැඳුම්කර මත 2011.08.28 වැනි දිනට රුපියල් හැටදෙලක්ෂ හතළිස් තුන්දහස් හත්සියතිස්දෙකකුත් ශත හැටතුනක (රු. 6,243,732.63) මුදලක් වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී රුපියල් හැටදෙලක්ෂ හතළිස් තුන්දහස් හත්සිය තිස්දෙකකුත් ශත හැටතුනක (රු. 62,43,732.63) මුදල සහ 2011.08.28 වැනි දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් පනස්අටලක්ෂ අටදහස් නවසියහත්තෑපහකුත් ශත හතළිස්හතරක (රු. 58,08,975.44) මුදල මත 2011.08.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 21.00% බැගින් තවදුරටත් පොළිය ද, ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි එම්. ඩබ්ලිව්. ත්‍රිවංක වරිත් සේනානායක විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

*උකසට තබන ලද දේපළ පිළිබඳ විස්තරය.*

01. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ දඬුගම පිහිටි, වරිපනම් අංක 447/100 දරන කිරිල්ලගහකුඹුර සහ දළුපොත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අනුර ඩබ්ලිව්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1015 සහ 2004.06.07 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක A වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : පාර සහ ඉවුරු බැම්මට වෙන්කළ ඉඩම් කොටස (මීටර් 20ක් පළල) ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් මැන සාදන ලද අංක 4450 දරන පිඹුරේ කැබලි අංක Y ද, දකුණට : බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් මැන සාදන ලද අංක 4450 දරන පිඹුරේ කැබලි අංක Y සහ X ද, අංක 3951 දරන පිඹුරේ කැබලි අංක 2 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් මැන සාදන ලද අංක 3951 දරන පිඹුරේ කැබලි අංක 1 ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1015 දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර හතරයි රූඩ් දෙකක් (අ. 4 රූ. 2 පර්. 0) හෙවත් හෙක්ටයාර් 1.8211ක් විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. තව ද බලයලත්, මිනින්දෝරු අනුර ඩබ්ලිව්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1015 සහ 2004.06.07 දින දරන පිඹුරේ නිරූපිත පාර සඳහා වෙන් කළ බිම් කොටසේ (මීටර් විස්සක් පළල) මාර්ග අයිතිය ද සමගය. මෙම දේපළ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 117/273 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

02. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ දඬුගම පිහිටි කඩොල්ගහකුඹුර සහ කඩොල්ගහ දළුපොත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අනුර ඩබ්ලිව්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1020 සහ 2004.07.15 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : පාර සහ ඉවුරු බැම්මට වෙන්කළ බිම් කොටස (මීටර් 20ක් පළල) ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු අනුර ඩබ්ලිව්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1015 සහ 2004.06.07 දින දරන පිඹුරේ කැබලි අංක A ද, දකුණට : කලපුව සහ කැබලි අංක 2 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් මැන සාදන ලද අංක 3732 දරන පිඹුරේ කැබලි අංක A ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1020 දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර හතරයි රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 4 රූ. 1 පර්. 20) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම දේපළ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 202/167 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

03. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ දඬුගම පිහිටි කඩොල්ගහකුඹුර සහ කඩොල්ගහ දළුපොත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අනුර ඩබ්ලිව්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1020 සහ 2004.07.15 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : පාර සහ ඉවුරු බැම්ම (මීටර් 20ක් පළල) සහ බලයලත් මිනින්දෝරු අනුර ඩබ්ලිව්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1015 දරන පිඹුරේ කැබලි අංක A ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් මැන සාදන ලද අංක 4450 දරන පිඹුරේ කැබලි අංක X ද, දකුණට : කලපුව ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු අනුර ඩබ්ලිව්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1020 දරන පිඹුරේ කැබලි අංක 1 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1020 දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර දෙකකුත් රූඩ් දෙකක් (අ. 2 රූ. 2 පර්. 0) හෙවත් හෙක්ටයාර් 1.01174ක් විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 173/7 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු කේ. කේ. සිල්වා විසින් මැන සාදන ලද අංක 253 සහ 1991.01.28 වැනි දින දරන පිඹුරේ නිරූපිත පාර සඳහා වෙන් කළ ඉඩම් කොටසේ (මීටර් විස්සක් පළල) මාර්ග අයිතිය ද සමගය. (එකී අංක 253 දරන පිඹුර ප්‍රකාරව මායිම් ලකුණු කර නොමැති අතර මෙම උපලේඛනයේ ඊට අදාළ මායිම් අඩංගු කර නොමැත)

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

08-79

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

2011.11.03 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඊ. එම්. යූ. එම්. කේ. ඒකනායක විසින් සහතික කරන ලද 2009.11.13 දිනැති අංක 161 දරන උකස් බැඳුම්කරය, මහජන නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2009.04.22 දිනැති අංක 1483 දරන බැඳුම්කරය හා 2010.05.24 දිනැති අංක 1715 දරන බැඳුම්කරය මත ණය ගිණුම මත මුල් මුදල හා 2011.09.25 දින තෙක් පොළිය වශයෙන් රුපියල් හැට එක් ලක්ෂ හතළිස් තුන්දහස් එකසිය දහතුනයි ශත තිස් දෙකක (රු.61,43,113.32) මුදල සමග රුපියල් පනස්හත් ලක්ෂ හැත්තෑහත් දහස් අනූදෙකයි ශත හැට අටක (රු. 57,77,092.68) මුදල මත වසරකට සියයට දහතුනයි දශම පහයි බිංදුව (13.5%) බැගින් පොලියක් 2011.09.26 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් කුරුණෑගල, අමුණුවත්ත අංක 11/7 හි පදිංචි කෙහෙළඹේ ආරච්චිලාගේ ප්‍රසන්න උදය කුමාර තිසේරා මහතා සහ නිල්මිණි ජානකි ජයරත්න හෙවත් වලිමුනිගේ නිල්මිණි ජානකි ජයරත්න මහත්මිය යන අයගෙන් එක්ව හා වෙන වෙනම අයවිය යුතුව ඇත.

2. එකී අංක 161, 1483 හා 1715 යන අංක දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් හැට එක් ලක්ෂ හතලිස් තුන් දහස් එකසිය දහතුනයි ශත තිස් දෙකක (රු. 61,43,113.32) මුදල සමග 2011.09.26 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට ගෙවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුරුණෑගල, මල්කඩුවාව, තල්ගොඩපිටිය මාවතේ අංක 33 හි පදිංචි වෙන්දේසිකාර එච්. ඩබ්. ඒ. ජයලාල් මහතාට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ, කුරුණෑගල අධිශ්‍රේණි ශාඛාවේ, ප්‍රධාන කළමනාකරුට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ තිරගංදහය කෝරලයේ, කුරුණෑගල මහ නගර සභා සීමාවේ හේනමුල්ල පිහිටි, "වැන්දමේ කුඹුර දැන් වත්ත", නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ඒ. ජී. රත්නායක විසින් සාදන ලද 1982.02.08 දිනැති අංක 1723 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 ඊසාන දිගට : එකී පිඹුරෙහි ලොට් 1 හා 2 ද, ගිණිකොණට : එකී පිඹුරෙහි ලොට 3 හා 4 ද, නිරිතට : ඉඩමේ ඉතිරි කොටස ද, වයඹට : පාරට වෙන් කළ කොටසක් වන එකී පිඹුරේ ලොට් 6 ද, මායිම්ව පර්චස් විස්සයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 20.25) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති සියලු දේද සහිතව එකී පිඹුරෙහි ලොට් 6 හා 7 භාවිතා කිරීමට ඇති අයිතියෙන්ද සමන්විත වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1144/277 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. පී. ජයතිස්ස,
(ප්‍රධාන කළමනාකරු).

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
කුරුණෑගල.

08-151

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ඩබ්ලිව්. ඩී. එන්. පීරිස් සහ ඩබ්ලිව්. එස්. ආර්. ප්‍රනාන්දු.
ගිණුම් අංක : 1030 5334 7410.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජී. අබේවික්‍රම යන අය විසින් ලියා සහතික කරන ලද 2008 මාර්තු මස 17 දාතම හා අංක 104 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වර්ණකුලසූරිය දිලිරා නිරෝෂන් පීරිස් සහ වර්ණකුලසූරිය සුසිල් රංජිත් ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී වර්ණකුලසූරිය දිලිරා නිරෝෂන් පීරිස් යන අය උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත්ලක්ෂ අනූ හත් දහස් පන්සිය හතලිහයි ශත පහළොවක (රු. 7,97,540.15) මුදලක් 2010 අගෝස්තු මස 10 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හත්ලක්ෂ අනූ හත් දහස් පන්සිය හතලිහයි ශත පහළොවක (රු. 7,97,540.15) මුදල ද 2010 අගෝස්තු මස 11 වැනි දින සිට අංක 104 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත්ලක්ෂ හතලිස් දහස් අටසිය අටයි ශත විසි නමයක (රු. 7,40,808.29) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 104 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ යටකලන් පත්තුවේ උතුරු තොඩුවාව ග්‍රාමයේ පිහිටි "වැල්ලබොඩ " යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. එෆ්. එච්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1996 නොවැම්බර් මස 14 දාමත හා අංක 2632 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සහ ඇනා ප්‍රනාන්දු යන අයගේ ඉඩම, නැගෙනහිරට : ලොට් 02, දකුණට : පාරේ සිට නිවාස දක්වා දිවෙන පාර සහ බස්නාහිරට : හලාවත සිට මහවැව දක්වා දිවෙන මහා මාර්ගය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 16.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2632 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිකාව K104/203 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

08-168

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| අගෝස්තු | 2012.08.03 | සිකුරාදා | 2012.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.10 | සිකුරාදා | 2012.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.17 | සිකුරාදා | 2012.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.24 | සිකුරාදා | 2012.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.30 | බ්‍රහස්පතින්දා | 2012.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2012.09.07 | සිකුරාදා | 2012.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.14 | සිකුරාදා | 2012.08.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.09.21 | සිකුරාදා | 2012.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.28 | සිකුරාදා | 2012.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2012.10.05 | සිකුරාදා | 2012.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.12 | සිකුරාදා | 2012.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.19 | සිකුරාදා | 2012.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.25 | බ්‍රහස්පතින්දා | 2012.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.* )

2012 ජුනි මස 23 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.